විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

# අමාත්‍ය විජිත හේරත් මැනිලා නුවර පැවති 33 වන ආසියාන් කලාපීය සංසදයට සහ අග්නිදිග ආසියාවේ මිත්‍රත්වය සහ සහයෝගීතා ගිවිසුමේ (TAC) 50 වන සංවත්සරයට සහභාගී වේ

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් 2026 ජූලි 23 වන දින සිට 24 වන දා දක්වා පිලිපීනයේ මැනිලා නුවර පැවති ‘33 වන ආසියාන් කලාපීය සංසදයේ (ARF) විදේශ අමාත්‍යවරුන්ගේ රැස්වීම සහ අග්නිදිග ආසියාවේ මිත්‍රත්වය සහ සහයෝගීතා ගිවිසුමේ (TAC) 50 වන සංවත්සර සැමරුම් උත්සවය සඳහා සනභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිසට නායකත්වය ලබා දුන්නේය.

ආසියාන් කලාපීය සංසද අමාත්‍ය රැස්වීම අමතමින්, අමාත්‍ය හේරත්, ආසියාන් කලාපීය සංසදයේ මූලික ප්‍රමුඛතා, විශේෂයෙන් සාමය, කලාපීය ස්ථාවරත්වය සහ සියල්ල ඇතුළත් ආර්ථික සමෘද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දැඩි කැපවීම නැවත තහවුරු කළේය. සාම සාධක මුලපිරීම් ඇතුළුව ආසියාන් කලාපීය සංසදයේ නායකත්වයෙන් යුත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සාමාජික රටවල් සමඟ වඩාත් සමීපව සම්බන්ධ වීමට ශ්‍රී ලංකාව දක්වන කැමැත්ත ද ඔහු ප්‍රකාශ කළේය.

"නැගී එන තර්ජන සහ අභියෝගවලට මුහුණ දීමේදී සහයෝගීතාව වැඩි දියුණු කිරීම" යන තේමාව යටතේ මැනිලා හි පැවති අග්නිදිග ආසියාවේ මිත්‍රත්වය සහ සහයෝගීතා ගිවිසුමේ 50 වන සංවත්සරය සැමරීමේ සැමරුම් උත්සවයට අමාත්‍ය හේරත් ද සහභාගී විය. රැස්වීමේදී කළ ප්‍රකාශයේ දී, විකාශනය වන ගෝලීය අභියෝග සාමූහිකව ආමන්ත්‍රණය කිරීමේදී, ගිවිසුම සම්බන්ධයෙන් සියලුම සාමාජික රටවල් අතර සමීප සහයෝගීතාවයේ වැදගත්කම අමාත්‍ය හේරත් නැවත අවධාරණය කළේය.

ආසියාන් කලාපීය සංසදයේ අමාත්‍ය රැස්වීමට සමගාමීව, අමාත්‍ය හේරත්, බංගලාදේශය, චිලී, කැනඩාව, පකිස්තානය, පිලිපීනය, නෙදර්ලන්තය, රුසියාව සහ සිංගප්පූරුව යන රටවල සිය පාර්ශ්වකරුවන් සමඟ ද්විපාර්ශ්වික රැස්වීම් පැවැත්වීය. ඔහු, දකුණු සහ මධ්‍යම ආසියාව සඳහා වූ එක්සත් ජනපද විශේෂ නියෝජිතවරයා සහ ඉන්දියාවේ එක්සත් ජනපද තානාපති, ආසියාන් මහලේකම්, යුරෝපා සංගමයේ ඉහළ නියෝජිත සහ ආසියානු සංවර්ධන බැංකුවේ උප සභාපති ද හමුවිය.

ආසියාන් කලාපීය සංසදයේ වැඩසටහනේ නිල කටයුතුවල අංගයක් ලෙස, පිලිපීන ජනාධිපති ෆර්ඩිනන්ඩ් ආර්. මාකෝස් ජූනියර් විසින් පවත්වන ලද රාත්‍රී භෝජන සංග්‍රහයකට ද අමාත්‍යවරයා සහභාගී විය.

අමාත්‍ය හේරත්, මින්ඩනාඕ දූපත වෙත සංචාරය කළ අතර, එහිදී ඔහු මින්ඩනාඕ හි ශ්‍රී ලංකා නිර්වේතනික කොන්සල් කාර්යාලය උත්සවාකාරයෙන් විවෘත කළේය. අමාත්‍යවරයා පිලිපීනයේ ශ්‍රී ලංකාවේ පළමු ආයෝජනය වන මින්ඩනාඕ හි පිහිටි ‘හේකාබ්’ ඉදිකිරීම් භූමිය නැරඹීමේ සංචාරයක ද නිරත විය.

පිලිපීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය චානක තල්පහේවා සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ අග්නිදිග ආසියානු සහ මධ්‍යම ආසියානු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් චමරි රොද්‍රිගෝ දූත පිරිසේ සෙසු සාමාජිකයින් ලෙස අමාත්‍ය හේරත් සමඟ මෙම සංචාරයට එක්වූහ.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**
**2026 ජූලි 29** වැනි දින


Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச",நாரஹேன்பிட்டி, கொழும்பு 5
2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk